රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 189

මගේ අංකය: වියු. 27 (ප්‍රති) I.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1981 පෙබරවාරි මස 26 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් වෙත.

**1980 ජූලි වැඩ වර්ජනය–වෘත්තීය සමිතිවලට දෙන ලද පහසුකම් ඉවත්කිරීම**

උක්ත කරුණ පිළිබඳව නිකුත් කරන ලද 1980 ජූලි මස 29 දින හා අංක 172 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි ඔබේ අවධානය යොමු කරමි.

02. වැඩ වර්ජනයට සම්බන්ධවූ වෘත්තීය සමිතිවල සාමාජිකත්වය දරණ, එහෙත් වැඩ වර්ජනයට සහභාගී නොවූ රජයේ නිලධාරීන්ගේ වෘත්තීය සමිති දායක මුදල් අයකර ගැනීමේදී,

(අ) දායක මුදල් ගෙවීම සිය කැමැත්තෙන් කරනු ලබන්නේ නම්, රජයේ නිලධාරීන්ගේ ලියාපදිංචි කළ වෘත්තීය සමිතිවල සාමාජිකයින්ගේ මාසික දායක මුදල්, ඔවුන්ගේ වැටුප් පතින් අයකර ගැනීම ගැන විරුද්ධත්වයක් නොමැති බවත්;

(ආ) මෙසේ දායක මුදල් අඩුකර ගැනීම තවදුරටත් එලෙසම කළයුතුදැයි, එසේ අඩුකිරීම් කරනු ලබන වෘත්තීය සමිතිවල සාමාජිකයින්ගෙන් විමසා බැලිය යුතු බවත්,

රජය තීරණය කර තිබේ.

03. ඉහත සඳහන් පරිදි කටයුතු කරනු මැනවි.

Siriwardhana

ලේකම්.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.